# සංක්ෂිප්තය

2006 වර්ෂයේ සිට ගෝලීය වශයෙන් ආහාර මිල අසාමාන්‍ය වේගයකින් ඉහළ යාමක් දක්නට ලැබෙන අතර විශේෂයෙන්ම 2007 දී සහ 2008 යන වසරවල එය කැපී පෙනෙන අගයක් ගනු ලැබීය. මෙම ප්‍රවණතාවය අනුව යමින් මෙම කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේද ආහාර මිල සීඝ්‍රයෙන් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් නාගරික, ග්‍රාමීය සහ වතු යන සෑම අංශයක ම ගෘහ ඒකකවල ආහාර වියදම් පියවා ගැනීම සඳහා විකල්ප උපායමාර්ග අනුගමනය කිරීමට සිදුවිය. ආහාර මිල ඉහළ යාමේ බලපෑමට දක්වන ප්‍රතිචාර ඒ ඒ අංශයේ ගෘහ ඒකකයෙන් ඒකකයට වෙනස් වේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේද ශ්‍රී ලංකාවේ ආහාර මිල ඉහළයාමට ප්‍රතිචාර වශයෙන් ඒ ඒ ගෘහ ඒකක විසින් ගනු ලබන විකල්ප උපාය මාර්ග සහ එම ගෘහ ඒකකයන්හි ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් දක්වන බලපෑම පිළිබඳව විමර්ශනය කිරීමයි. මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත හා ද්විතියික දත්ත භාවිතා කරන ලදී. එසේම සමීක්ෂණ නියැදිය සඳහා බහු පියවර, ස්ථර, සසම්භාවී නියැදි ක්‍රම භාවිතා කරනු ලැබිණි. සමස්ත නියැදිය ගෘහ ඒකක 250කින් සමන්විත වේ. ගෘහ ඒකක මට්ටමේ ආහාර සුරක්ෂිතතාවය ඇස්තමේන්තු කිරීම සඳහා ලෝක ආහාර වැඩසටහන (WEP) මගින් ගොඩනගන ලද ආහාර පරිභෝජන මට්ටම් (Food Consumption Score) ඇස්තමේන්තු කිරීමේ ආකෘතිය භාවිතයට ගනු ලැබීය. ඒ අනුව සංඛ්‍යාත්මකව ඒකක 40ට පහළ පරිභෝජන මට්ටමක් නිරූපණය වන ගෘහ ඒකක ආහාර අනාරක්ෂිතභාවයට පත්වී යැයි හඳුනාගනු ලැබීය.

ආහාර මිල ඉහළයාම පිළිබඳ විශ්ලේෂණය අනුව, 2007 සිට 2009 දක්වා කාලය තුළ සහල් මිල 60%කින් ඉහළ ගොස් ඇත. එමෙන්ම තිරිඟු පිටි 37%කින්ද, පාන් 40%කින්ද, මාංශ භෝග 38%කින්ද, අර්තාපල් 22%කින්ද වශයෙන් ඉහළ ගොස් ඇත. එමෙන්ම කිරිපිටි මිල 35%ක් හා සීනි මිල 47%කින් වැඩි වී ඇති බැව් හඳුනාගත හැකිය. සෑම ගෘහ ඒකකයකම ආහාර සුරක්ෂිතතාවය සඳහා එය බලපා ඇති අතර, විශේෂයෙන්ම වතු, නාගරික, පැල්පත් සහ ධීවර ගෘහ ඒකකයන් සඳහා බලපෑම ඉහළ අගයක් ගනී. ඇස්තමේන්තු කරන ලද ආහාර පරිභෝජන මට්ටම පිළිබඳ ආකෘතියට අනුව, සමස්ත නියැදියෙන් 14%ක් ආහාර අනාරක්ෂිතතාවයට පත්ව සිටී. ආහාර මිලදී ගැනීමේ ප්‍රධාන මූලාශ්‍රය විවෘත වෙළෙඳපොළයි. එම ප්‍රමාණය 73%ක් වේ. ග්‍රාමීය අංශය හැර අනෙකුත් අංශයන් සඳහා එය ආසන්න වශයෙන් 100%කි. මෙම අධ්‍යයනයේදී තවදුරටත් ආහාර මිල ඉහළ යාම හමුවේ ගෘහ ඒකක විසින් ගනු ලබන විකල්ප උපාය මාර්ග පිළිබඳව විශ්ලේෂණය කරනු ලැබීය. ඒ අනුව, සාපේක්ෂව අඩු මිල ආහාර මිලදී ගැනීම සහ මිලට ගනු ලබන ප්‍රමාණය අඩු කිරීම (80%), ණය පදනම මත මිලට ගැනීම (66%), දෛනිකව පරිභෝජනය කරනු ලබන ආහාර ප්‍රමාණය අඩු කිරීම (66%) සහ මිතුරන් සහ අසල්වැසියන්ගෙන් ඉල්ලා ගැනීම (57%) ප්‍රධාන විකල්ප උපාය මාර්ගයන් වශයෙන් හඳුනාගන්නා ලදී. එසේම ආහාර මිලදී ගැනීම සඳහා ණය ලබාගැනීම (17%) තවත් විකල්ප ක්‍රියාමාර්ගයන් ලෙස හඳුනාගන්නා ලද අතර, එය දෙවෙනි වන්නේ නිවාස සෑදීම සහ අළුත්වැඩියා කිරීම (26%) සහ කෘෂි යෙදවුම් මිලට ගැනීමට (21%) පමණි.

ගෘහ ඒකකවල ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා වතු නාගරික පැල්පත් සහ ධීවර ගෘහ ඒකකවල වඩා දිළිඳු ගෘහ ඒකක ඉලක්ක කරගනිමින් දැනට ක්‍රියාත්මක වන ආහාර ආධාර වැඩසටහන් නැවත සංවිධානය කිරීම, ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් සඳහා දිළිඳු ගෘහ ඒකකවල සාමාජිකයින්ගේ සහභාගීත්වය ලබාගනිමින් ආදායම් ඉපයීමේ අවස්ථා ඇති කිරීම මගින් ඔවුන්ගේ මිලට ගැනීමේ හැකියාව ඉහළ දැමීම හා ණය බරින් මුදවා ගැනීමට අවස්ථාව සලසාදීම මගින් සියලුම අංශයන් ආවරණය වන පරිදි විශේෂ ගෙවතු සංවර්ධන වැඩසටහන් ඇති කිරීම, සුදුසු ව්‍යාප්තිකරණ යාන්ත්‍රණයක් හඳුන්වාදීම සහ ගෘහණියන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් ඇති කිරීම, ප්‍රාදේශීය වශයෙන් ආහාර නිෂ්පාදනය ඉහළ දැමීම මගින් ආහාර මිල අඩු කිරීමට කටයුතු කිරීම හා එය දිළිඳු ජනතාවගේ ආහාර මිලදීගැනීමේ හැකියාව ඉහළ දැමීම සඳහා ඉවහල් කරගැනීම මෙම අධ්‍යයනය මගින් නිර්දේශ කෙරේ.